# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2248/66 - 2021 ඔක්තෝබර් මස 09 වැනි සෙනසුරාදා - 2021.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:*
කේඩීඑස්/කේජීකේ/4/2(1)/2/16.
(*පැරණි ගොනු අංකය:* කේඩීඑස්/කේජීකේ/4/2 (3)/2/පොදු).
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2016/එච්ඩබ්ලිව්/01.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟවටකෝරළේ සුළු කොට්ඨාසයේ, අනිවත්ත බටහිර වසම (233) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දොඩම්වල (කොට්ඨාස අංක 9 අනිවත්ත දොඩම්වල) මහනුවර මහ නගර සභාව ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන පිළියෙළ කරන ලද 2019.10.04 දිනැති මූලික පිඹුරු අංක මහ 6487 හි කැබලි අංක 1,2,3,10,11 සහ 12 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0462 ක් වූ පහත සඳහන් ඉඩම් කැබලි:

01. කැබලි අංක 01
ඉඩමේ නම: -; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.0015.

02. කැබලි අංක 02
ඉඩමේ නම: හලවේවත්ත හෙවත් හල්ලේමුල්ලේ වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.0015.

03. කැබලි අංක 03
ඉඩමේ නම: හලවේවත්ත හෙවත් හල්ලේමුල්ලේ වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: හබරගමුරාලලාගේ නිමල් නිශාන්ත පීරිස්; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.0011.

04. කැබලි අංක 10
ඉඩමේ නම: -; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.0078.

05. කැබලි අංක 11
ඉඩමේ නම: නාගස්තැන්නවත්ත හෙවත් දිග්ගලේවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.0009.


G 35084 - 25 (2021/10)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

06. **කැබලි අංක 12**
ඉඩමේ නම: නාගස්තැන්නවත්ත හෙවත් දිග්ගලේවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: සීමාසහිත මහනුවර විවිධසේවා සමූපකාර සමිතිය; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.0334.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021.12.15 දින පෙ.ව.11.00ට මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2021.12.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

යූ.ජේ.එම්.එස්.එස්.බී.ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ.

2021 ඔක්තෝබර් මස 05 වැනි දින,
මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 317

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.